2019.10.17 දිවයින

පිටු 02

# වත්මන් ආර්ථිකය ගැන ප්‍රසිද්ධ විවාදයකට එන්න

## බන්දුලගෙන් හර්ෂට අභියෝගයක්

ශ්‍යාම් නුවන් ගනේවත්ත

වත්මන් ආර්ථිකයේ ඇති වී තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් ඕනෑම නාලිකාවක ප්‍රසිද්ධ විවාදයකට එන ලෙස තමා ආර්ථික කටයුතු රාජ්‍ය ඇමැති ආචාර්ය හර්ෂ ද සිල්වා මහතාට ආරාධනා කරන බව ඒකාබද්ධ විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා ඊයේ (15 දා) උදේ පිටකෝට්ටේ වියත් මග මූලස්ථානයේදී පැවති මාධ්‍ය හමුවකදී පැවසීය.

හොඳට තිබුණු රටක් අපිට වෙච්ච දෙයක් ගැන ප්‍රසිද්ධ සංවාදයකට පැමිණෙන ලෙස තමා ඉතාම කරුණාවෙන් තම උගත් මිත්‍ර ආචාර්ය හර්ෂද සිල්වා මහාතට ආරාධනය කරන බවද ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා කීවේය.

මඩින් නොව ගොඩින් බොහොම ශාස්ත්‍රීය ආකාරයට සංඛ්‍යා දත්ත සහිතව තමන් දෙදෙනාට එම විවාදය පවත්වාගෙන යා හැකි බවද ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා කියා සිටියේය. ආර්ථිකයේ ඇති වෙලා තියෙන්නේ සමෘද්ධියක්ද, කඩා වැටීමක්ද එහෙම නැත්නම් පටාචාර ආර්ථිකයක්ද රටට යහපතක් වුණාද අයහපතක් වුණාද යන්න ගැන ඕනෑම නාලිකාවක මේ විවාදයට තමා සූදානම් බවද ඒ සඳහා තම උගත් මිත්‍ර ආචාර්ය හර්ෂද ද සිල්වා මහතාට ගෞරවයෙන් ආරාධනා කරන බවද ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා කීවේය.

මේ වන විට ආර්ථිකයේ දරුණු කඩා වැටීමක් සිදුව ඇති බවත් එසේම ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර ඇති නිල නිවේදනයට අනුව 2019 දෙවන කාර්තුවේ ආර්ථික වර්ධනය සියයට 1.6 ක් දක්වා අඩු වී ඇති බවත් හෙතෙම කීවේය.

එසේම 2019 වසරේ සමස්ත ආර්ථික වර්ධනය



සියයට 4 සිට සියයට 2.7 දක්වා පහත වැටෙන බවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පුරෝකථනය කර ඇති බවද ඔහු කීවේය.

යුද ජයග්‍රහණයෙන් පසු 2010 සිට 2014 දක්වා වසර පහේදී ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ආර්ථික වර්ධන වේගය සියයට 7 ක් වූ බවත් එය පසුගිය 2015 සිට 2019 දක්වා වර්ෂ පහ තුළදී සියයට 3.7 දක්වා පහත වැටී ඇති බවද ආචාර්ය බන්දුල ගුණවර්ධන මන්ත්‍රීවරයා කීවේය.

එසේ තිබියදී මුදල් ඇමැති මංගල සමරවීර මහතා සහ ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා මාධ්‍ය හමුවක් පවත්වා කියනවා පුදුම විදියට රට සංවර්ධනය වෙලා. ආදායම් මාර්ග වැඩි වෙලා ලේඩීස් සැලෝන් යන එක වැඩි වෙලා කියලා. ඔවුන් එසේ බොහොම සිනහමුසු මුහුණින් කියන බවද එහෙත් ආර්යාවන් සැලෝන්වලට විශාල ලෙස ගියත් මේ රටේ බොහෝ භාර්යාවන්ට සැලෝන්වලට යනවා තබා අති මහත් බහුතර කාන්තාවන් තමා ගත්ත ණය ටිකවත් ගෙවාගත නොහැකිව සිය දිවි නසා ගන්නා තත්ත්වයට පත්ව ඇති බවද ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා තවදුරටත් කීවේය.